# පළවෙනි සභාපතිත්වයේ සහ බැහැදැක ඉගැන්වීමේ පණිවුඩ, ජනවාරි 2013

# පළවෙනි සභාපතිත්වයේ පණිවුඩය, ජනවාරි 2013

## ස්වාමීන්වහන්සේගේ හඬ

**සභාපති හෙන්රි බී. අයිරින් විසිනි**

**පළවෙනි සභාපතිත්වයේ පළවෙනි උපදේශකවරයා**

සෑම තැනකම සිටින සෑම කෙනෙකුටම ස්වාමීන්වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ හඬ ඇසීමට දහම සහ ගිවිසුම ආරාධනාකරයි (බලන්න ඩීසහගී 1:2, 4, 11, 34; 25:16).එය තෝරාගත් අනාගතවක්තෘවරුන්ට එළිදරව් තුලින් දුන් උන්වහන්සේගේ පණිවුඩවලින්, අවවාදවලින්, සහ දිරිගන්වන අනුශාසනාවලින් පිරී ඇත. මෙම එළිදරව් තුලින් දෙවියන්වහන්සේ අපගේ ඇදහිලිමත් යාච්ඤාවලට පිළිතුරු දෙන අන්දම අපට දැකගත හැකිය.

අපේ යාච්ඤාවලින් දෙවියන්වහන්සේ අපෙන් අපේක්ෂාකරන්නේ මොනවාද, මෙම ජීවිතයේදී සහ ඊළඟ ජීවිතයේ සමාදානය ලැබීමට අප කුමක් කළ යුතුද, සහ අප ඉදිරියේ තිබෙන්නේ මොනවාද යන ප්‍රශ්න වලට අපි පිළිතුරු සොයන්නෙමු. සාමාන්‍ය ජනතාව සහ අනාගතවක්තෘවරුන් යටහත් පහත් යාච්ඤා තුලින් අසන එවැනි ප්‍රශ්නවලට පිළිතුරු වලින් දහම සහ ගිවිසුම පිරී ඇත. අපගේ ලෞකික ජීවිතයේ සහ සදාකාලික ගැලවීමේ යහපත්කම ගැන ප්‍රශ්නවලට පිළිතුරු අපට උගන්වන එය වටිනා මගපෙන්වීමක් විය හැකිය.

ස්වාමීන්වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල නිහතමානීත්වය සහ ඇදහිල්ල යතුරුවේ. මෝර්මන්ගේ පොත පරිවර්තනයේදී උපකාරකිරීමට ඔලිවර් කව්ඩරි තුල වූ කැමැත්ත ගැන ස්වාමීන්වහන්සේගෙන් ඔහුට පිළිතුරක් ලැබිනඃ "ඇදහිල්ල නැතිව නුඹට කිසිවක් කළ නොහැකි බව මතකතබාගනින්න; එමනිසා ඇදහිල්ලෙන් අසාපන්න. මේ දේවල් සමග සෙල්ලම් නොකරන්න; නුඹ ඇසිය නොයුතු දේවල් නොයිල්ලන්න" (ඩීසහගී 8:10).

නැවත නැවත අපට උපකාරකිරීමට පෙර ස්වාමීන්වහන්සේ දහම සහ ගිවිසුම තුලින් අපෙක්ෂාකරන්නේ අපගේ ඇදහිල්ල සහ යටහත් පහත්කමය. මෙයට එක් හේතුවක් නම්, උන්වහන්සේගේ පිළිතුරු අපි අපේක්ෂාකරන ක්‍රමයට නොලැබීමය. ඒවා නිතරම පිළිගැනීමද පහසු නැත.

සභා ඉතිහාසය සහ අපේ මුතුන්මිත්තන්ගේ අත්දැකීම් මෙම සත්‍යතාවය විදහාපායි. මගේ මුත්තා, හෙන්රි අයිරින් 1855දී ඔහුට ඇසුනු නැවත පිහිටුවන ලද සුභාරංචිය පිළිගත යුතුදැයි දැනගැනීමට ඉතා උද්‍යෝගීව යාච්ඤා කළේය. පිළිතුර පැමිණියේ සිහිනයක් තුලින්ය.

ඔහු ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වැඩිහිටි එරස්ටස් ස්නෝ සහ විලියම් බ්‍රවුන් නම් වැඩිහිටියෙකුද සමග මේසයක් අසල හිඳගෙන සිටිනු සිහිනෙන් දුටුවේය. වැඩිහිටි ස්නෝ ඔහුට සුභාරංචියේ මූලධර්ම පැයක පමණ කාලයක් ඉගැන්වූ බව පෙනින. වැඩිහිටි ස්නෝ මෙසේ කීවේය, "යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බව්තීස්මවීමට මම ඔබට අණකරමි, තවද මේ මිනිසා [වැඩිහිටි බ්‍රවුන්] … ඔබව බව්තීස්මකරනු ඇත."1 අප්‍රේ, ශාන්ත ලුවිස්, මිසුරි, වැසිවතුර තටාකයක උදෑසන 7.30ට වැඩිහිටි බ්‍රවුන් මගින් බව්තීස්මවීමට හෙන්රි අයිරින්ට ඇදහිල්ල සහ යටහත් පහත් බව

තිබීම ගැන මගේ පවුල කෘතඥවන්නේය.

ඔහුගේ යාච්ඤාවට පිළිතුර ස්වාමීන්වහන්සේගෙන් කණට ඇසෙන ශබ්දයකින් ආවේ නැත. එය පැමිණියේ ලිහායිට මෙන්, රාත්‍රී කාලයේදී ලැබුනු දර්ශනයක් සහ සිහිනයක් තුලින්ය (බලන්න 1 නෙපී 8:2).

හැඟීමක් ලෙසද පිළිතුරු පැමිණිය හැකි බව ස්වාමීන්වහන්සේ අපට උගන්වා ඇතිසේක. දහම සහ ගිවිසුම තුලින් උන්වහන්සේ ඔලිවර් කව්ඩරිට මෙසේ ඉගැන්වූසේක, "බලන්න, මම නුඹගේ මනසට සහ හදවතට ශුද්ධාත්මයාණන් මගින් කියමි, උන්වහන්සේ නුඹ වෙත පැමිණ නුඹගේ හදවතේ වාසයකරනසේක" (ඩීසහසී 8:2).

තවද උන්වහන්සේ ඔලිවර් කව්ඩරිව මෙලෙස දරිගැන්වූසේක: "මේ කාරණාව ගැන මම නුඹගේ මනසට සමාදානය කථා කළේ නැතිද? මීට වඩා කුමන මහත් සාක්ෂියක් නුඹට දෙවියන්වහන්සේගෙන් ලබාගත හැකිද?" (ඩීසහසී 6:23).

දහම සහ ගිවිසුම, සභා ඉතිහාසය, සහ හෙන්රි අයිරින් ඔහුගේ බව්තීස්මයෙන් පසුව ඔහුගේ දූතමෙහෙය ගැන තැබූ ඉතිහාසයද අනුව අපට ලැබෙන පිළිතුරු අනතුරු ඇඟවීමක් මෙන්ම සමාදානයක හැඟීමක් ලෙසද පැමිණිය හැකි බව බව මට උගන්වා ඇත.

1857 අප්‍රේල් මස, ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ ගණපූර්ණයේ වැඩිහිටි පාලි පී. ප්‍රැට් දැන් අඑජ. ඔක්ලහෝමා නමින් හැඳින්වෙන ස්ථානයේ සම්මන්ත්‍රනයකට සහභාගිවිය. හෙන්රි අයිරින් වාර්තා කළ පරිදි වැඩිහිටි ප්‍රැට්ගේ "මනස අඳුරු පෙරනිමිතිවලින් පිරීතිබූ නිසා… ,අනාගතය හෝ ගැලවීමේ මගක් ගැන වටහාගැනීමට නොහැකිව ඇත."2 ඉන්පසුව ප්‍රේරිතවරයාගේ ජීවිත පරිත්‍යාගයේ දුක්මුසු පුවත හෙන්රි වාර්තාකර තැබීය.

ස්වාමීන්වහන්සේ නිතරම යටහත් පහත් ඇදහිලිමත් යාච්ඤාවලට පිළිතුරු දෙන බව මගේ සාක්ෂියයි. දහම සහ ගිවිසුම මෙන්ම අපේ පුද්ගලික අත්දැකීම්ද අපට උගන්වන්නේ එම පිළිතුරු හඳුනාගෙන ඒවා මගපෙන්වීම්, සත්‍යය ස්ථිරකිරීම් හෝ අනතුරු ඇඟවීම් වුවද, ඇදහිල්ලෙන් පිළිගන්නා ලෙසය. අපි නිතරම ස්වාමීන් වහන්සේගේ ප්‍රේමනීය හඬට සවන්දී හඳුනාගැනීම මගේ යාච්ඤාවයි.

සටහන්

1. "The Journal of Henry Eyring: 1835–1902" (ප්‍රකාශනය නොකළ අත් පිටපත් හිමිකරු සන්තකයේ ඇත).
2. "The Journal of Henry Eyring: 1835–1902."

මෙම පණිවුඩයෙන් ඉගැන්වීම

1. මෙම පණිවුඩයේ එන යාච්ඤාව ගැන වාක්‍යකණ්ඩ එක්ව කියවීම ගැන සලකා බලන්න. ඔබ කියවන විට, දෙවියන්වහන්සේ යාච්ඤාවලට පිළිතුරු දෙන අන්දම ගැන ප්‍රවේශමෙන් සවන්දීමට පවුල් සාමාජිකයන්ට කියන්න. යාච්ඤාවේ වැදගත්කම ගැන සාක්ෂිදැරීම ගැන සලකාබලන්න.

2. ජනතාව යාච්ඤාව තුලින් ඇසූ ප්‍රශ්නවලට දුන් පිළිතුරුවලින් දහම සහ ගිවිසුම පිරී ඇත. ඔවුන්ගේ පශ්නවලට දුන් පිළිතුරු (එළිදරව්) වාර්තාකර නොතිබුනේ නම් කුමක් සිදුවේද? ආත්මයාණන් වහන්සේගේ පෙළඹවීම් හඳුනාගැනීමට ඉගෙනගෙන ඒවා අනුගමනයකිරීමට පවුල් සාමාජිකයන් දිරිගන්වන්න. යාච්ඤාව ගැන අදහස් ඔවුන්ගේ ජර්නලයේ සටහන්කිරීමට ඔවුන්ට අවශ්‍යවිය හැකිය

පෙළඹවීම්වලට සවන්දීම

මාරියා ඉසබෙල් මොලිනා විසිනි

එක් රාත්‍රියක මගේ තරුණ නැනා නිවසින් පැන ගිය නිසා, මම ඉක්මණින් ඇය

සොයා ගියෙමි, මම ධාවනයකරන විට, මට උදව්කරන ලෙස ආත්මයාණන්ට යාච්ඤාකලෙමි. දෙවියන්වහන්සේ මට පිළිතුරුදී මගපෙන්වන බව මම දැනසිටි නිසා ආත්මයාණන්ගේ පෙළඹවීම්වලට සවන්දීමට උත්සාහ කලෙමි, නමුත් මට කිසිවක් නැසෙන විට, බලාපොරොත්තු කඩවී, ආත්මයාණන් මා පොලොඹවන්නේ නැති බවට හැඟීමක් මට ඇතිවිය.

තවත් ඈතට ගොස් සෙවීමට මට වුවමනා වුවද, මගේ නැනාගේ නිවස අසල ප්‍රදේශයේ සිටීමට හැඟීමක් මට ඇතිවිය. එනිසා එම ප්‍රදේශයේ තවත් වරක් ධාවනයකිරීමට මම තීරණය කලෙමි. මම මංසන්ධියක නතරකළ විට, ගමන්කරන තරුණ ගැහැණු ළමයෙක්ගේ ඡායාවක් මම දුටුවෙමි. මට මාගේ නැනෑ සම්භවිය.

මා කාරයෙන් බිමට බැස ඇය වෙතට දිවයන විට, ආත්මයාණන් මට දිගටම මග පෙන්වමින් එම ප්‍රදේශයේම සිටීමට හැඟීමක් දුන් බව මට අවබෝධවිය. මා නිසල හඬට සවන්දෙමින් සිටි නිසා, ආත්මයාණන්ගේ පෙළඹවීම් සම්පූර්ණයෙන්ම අතපසු විය. බොහෝ අවස්ථාවලදී අපට ශබ්දයක් නොඇසෙන නමුත් අපගේ හදවත්වලට තද හැඟීමක් දැනෙන බවත් මට එවිට අවබෝධවිය.

ආත්මික මගපෙන්වීම්වලට මම බොහෝ ස්තුතිවන්ත වුනෙමි. සත්‍යලෙසම උන්වහන්සේ නිතරම සිටිනසේක! "ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹගේ නිරන්තර සහායකයාවනසේක" ධීසහසී121:46).

අපි ආත්මික මගපෙන්වීම්වලට සුදුසුවී අපගේ අවධානය යොමුකරන්නේ නම්, අපට දෙවියන්වහන්සේගේ හස්තයේ මෙවලමක්වී බොහෝ දෙනෙකුට යහපතකළ හැකිය. ආත්මයාණන්ගේ නිරන්තර මිත්‍රත්වය තිබීමෙන් අප යායුත මාවත දැනගැනීමට අපට පුළුවන.

යාච්ඤාවක වික්‍රමය

යාච්ඤාවලට බොහෝ විවිධාකාරයෙන් පිළිතුරු දිය හැකි බව සභාපති අයිරින් උගන්වයි. එවැනි මාර්ග කිහිපයක් සොයාගැනීමට ශුද්ධලියවිලි සෙවීමට ඔබට හැකිය

පහත සඳහන් එක් එක් ශුද්ධ ලියවිල්ල දෙස බලන්න. යාච්ඤාවට පිළිතුරු ලැබීම ගැන මෙම ශුද්ධ ලියවිලිවලින් පැවසෙන දේවල් ගැන ඔබගේ ජර්නලයේ වචන කිහිපයක් ලියන්න.

යාච්ඤාවලට ලැබුනු පිළිතුරු ගැන ඔබගේ අත්දැකීම්ද ඔබගේ ජර්නලයේ ලිවීමට ඔබට පුළුවන.

යොහාන් 14:26

දහම සහ ගිවිසම 6:22–23

දහම සහ ගිවිසුම 8:2

දහම සහ ගිවිසුම 9:8–9

හිතෝපදේශ 8:10–11

© 2013 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතියඃ 6/12. පරිවර්තන අනුමැතියඃ 6/12. First Presidency Message, January 2013 පරිවර්තනයයි. Sinhala 10661408

# බැහැදැක ඉගැන්වීමේ පණිවුඩය. ජනවාරි 2013
# ධර්මදූත කටයුතු

මෙම ලිපිය යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකර, අදාල පරිදි, ඔබ බැහැදකින සොහොයුරියන් හා එය බෙදාගන්න. ඔබේ සොහොයුරියන් ශක්තිමත්කිරීමට සහ සහන සමිතිය ඔබගේම ජීවිතයේ ක්‍රියාකාරී කොටසක් කරගැනීමට ඔබට උපකාරවත්වන ප්‍රශ්න අසන්න. **වැඩිදුර තොරතුරු සඳහා යන්න reliefsociety.lds.org.**

පසු-දවස්වල ශුද්ධවන්තයන් ඉදිරියට යවන්නේ "මිනිසුන්ගේ ප්‍රාණවල ගැලවීම සැලැස්වීම සඳහා [ස්වාමීන්වහන්සේගේ] මිදිවත්තේ සේවයකිරීමටය" (ධීසහසී 138:56), එයට ධර්මදූත කටයුතුද ඇතුළත්ය. සුභාරංචිය දේශනාකිරීමට විධිමත් දූතමෙහෙයක කැඳවීමක් අපට අවශ්‍ය නොවේ. සුභාරංචිය මගින් ආශිර්වාදිතවන ජීවිත අප වටා ඇති අතර, අපි අපවම සූදානම්කරගන්නා විට, ස්වාමීන්වහන්සේ අපට ආශිර්වාදකරනසේක. ඔවුන්ගේ ආත්මික වගකීම් වැළඳගෙන "මිනිසාගේ අමරණීයත්වය සහ සදාකාලික ජීවනය සිද්ධකිරීමට" (මෝසෙස් 1:39) උපකාරකිරීමට බැහැදැක උගන්වන ගුරුවරියන්ට පුළුවන.

අනාගතවක්තෘ ජෝසෆ් ස්මිත් 1842 දී සහන සමිතිය සංවිධානයකළ විටදී, කාන්තාවන්ට දුප්පතුන් ගැන සොයාබැලීම පමණක් නොව, ආත්ම ගලවාගැනීමද අයත් බව කීවේය. 1 මෙය තවමත් අපගේද අරමුණකි.

"ස්වාමීන්වහන්සේ ... සත්‍යයේ සාක්ෂිය පවරන්නේ එය අන් අය හා බෙදාගන්නා අයටය," යයි සභාපති ඩීටර් එෆ්. උක්ඩෝෆ්, පළවෙනි සභාපතිත්වයේ දෙවන උපදේශකවරයා පැවසීය. "ස්වාමීන්වහන්සේ තමන් සභාවෙන් වැඩිදුරටත් අපේක්ෂාකරන්නේ, 'සියලු අවස්ථාවන්හිදී [ඔවුන්ගේ මුඛයන්] විවෘතකර [උන්වහන්සේගේ] සුභාරංචිය ප්‍රීතිමත් ශබ්දයකින් ප්‍රකාශකිරීමය' (ධීසහසී 28:16). ... සමහර අවස්ථාවලදී සාක්ෂියක තනි වාක්‍ය කණ්ඩයකින් ආරම්භවන සිද්ධීන් යමෙකුගේ ජීවිතයට සදකාලය දක්වා බලපෑමක් කළ හැකිය."2

ශුද්ධලියවිලි වලින්

දහම සහ ගිවිසුම 1:20–23; 18:15; 123:12

අපගේ ඉතිහාසයෙන්

අපගේ සහන සමිති ඉතිහාසයේ සාමාජික ධර්මදූත කටයුතු ගැන මුල්කාලීන චෙකෝස්ලෝවෙකියාවේ ඔල්ගා කොවරෝවාගේ කථාව උදාහරණයකි. 1970 ගණන්වලදී, වෛද්‍ය උපාධිධාරී ශිෂ්‍යාවක්වූ ඔල්ගා දැඩි ආත්මික ජීවිතයකට ආශාවෙන් සිටියාය. 75 හැවිරිදි ඔට්කාර් වොග්කුකා නම්, පසු-දවස්වල ශුද්ධවන්තයෙක් ඇය දුටුවාය. " ඔහු මට වයස හැත්තෑ-පහක කෙනෙක් වුවද, ඔහුගේ හදවත දහ-අටකට සමීප සතුටින් පිරුන එකක් විය" යයි ඇය කීවාය. "එය එකල අසුභවාදීව පැවති චෙකෝස්ලෝවැකියාවට අසාමාන්‍ය දෙයක්විය."

ඔටාකාර් සහ ඔහුගේ පවුලේ අය හමුවූ ඔල්ගා ඔවුන්ට එම සතුට ලැබුනේ කෙසේදැයි ඇසුවාය. ඔවුහු ඇයව වෙනත් සාමාජිකයන්ට හඳුන්වාදී ඇයට මෝර්මන්ගේ පොතක්ද දුන්නෝය. එය ඉතා ආශාවෙන් කියවූ ඇය, ඉක්මණින්ම බව්තීස්මවී ස්ථිරවූවාය. එතැන් සිට ඔල්ගා දේශපාලන හිරිහැර සහ ආගමික වධහිංසා සහිත ලෝකයක යහපතට පෙළඹවීමක් වූවාය. ඇයගේ කුඩා ශාඛාවේ සහන සමතියේ සභාපතිනියවූ ඇය, අන් අයව සභාවට ගෙන ඒම මගින් ප්‍රාණ ගලවාගැනීමට උපකාරවූවාය.

මට කුමක් කළ හැකිද/

1. මා බැහැදකින සොහොයුරියන් සමග මගේ සාක්ෂිය බෙදාගන්නා විටදී මම ශුද්ධාත්මයාණන්වහන්සේගේ පෙළඹවීම් අනුගමනය කරන්නෙම්ද?

2. මා රැකබලාගන්නා සොයුරියන්ට සුභාරංචිය ඉගෙනගැනීමට මා උපකාරකරන්නේ කෙසේද?

සටහන්

1. බලන්න *Teachings of Presidents of the Church: Joseph Smith* (2007), 453.
2. ඩීටර් එෆ්. උක්ඩෝෆ්, "Waiting on the Road to Damascus," *ලියහෝනා* මැයි 2011, 76–77.
3. බලන්න *Daughters in My Kingdom: The History and Work of Relief Society* (2011), 92–95.

© 2013 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී.
ඉංග්‍රීසි අනුමැතිය: 6/12. පරිවර්තන අනුමැතිය: 6/12. Visiting Teaching Message, January 2013 පරිවර්තනයයි. Sinhala 10661 408